# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,985 - 2016 සැප්තැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2016.09.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1604 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1607 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 1614 |


*සැ. යු.* - සත්ව ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත 2016 ජුනි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ඔක්තෝබර් මස 07 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 සැප්තැම්බර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## පස්ගොඩ ප්‍රාදේශීය සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයට අදාළව පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*උපලේඛනය*

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය හා වැටුප් කේත අංකය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | රියදුරු III | 01 | 03/2016 PL-3 125,790-270x10-300x10-330x10-350x12-රු. 38,990 | I. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී ඕනෑම විෂයයන් හයක්වත් සමත් වී තිබීය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර)<br>II. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුනත්වය පිළිබඳ නිකුත් කරන ලද බර වාහන බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.<br>III. වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(01) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය,
(02) අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය,
(03) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය,
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන්ට වයස් සීමාව බල නොපානු ඇත.)
(04) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය,
(05) සුදුසුකම් පරීක්ෂා කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව සුදුස්සන් තෝරා ගනු ලැබේ,
(06) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු හෝ දඩුවම් ලැබුවෙකු නොවිය යුතු ය,
(07) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය,
(08) පස්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ ස්ථිර පදිංචි අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලබන අතර, සභාවේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(01) ඉහත අනු අංක 01 හි සඳහන් තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(02). සේවය ස්ථිර කරනු ලැබීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

(03). මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග රජය හා දකුණු පළාත් සභාව වරින්වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

04. *අයදුම්පත් එවිය යුතු ආකාරය :*

(01) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍ර ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු අතර, අයදුම්පත් 2016.10.30 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, පස්ගොඩ ප්‍රාදේශීය සභාව, ඌරුබොක්ක යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් පමණක් එවිය යුතු ය. ඉල්ලුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

(02) අයදුම්පත් සමග පහත සඳහන් සහතික පිටපත් අමුණා එවිය යුතු ය.

- ✓ උප්පැන්න සහතිකය,
- ✓ අධ්‍යාපන සහතිකය,
- ✓ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය,
- ✓ මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත් සහතිකයක් විය යුතු ය.)

ආර්. දිනූෂා ලක්මාලි,
ලේකම්,
පස්ගොඩ ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 23 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය සභාවේදී ය.

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ...............................**
**තනතුර සඳහා අයදුම් පත්‍රය**

01. (I) අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————.
(II) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.

02 ස්ථිර ලිපිනය :——————————.

03. (I) උපන් දිනය :
අවුරුද්ද :———. මාසය :———. දිනය :———.

(II) ............දිනට වයස :
අවුරුදු :———. මාස :———. දින :———.

04. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.

06. විවාහක/අවිවාහක බව :——————————.

07. ජාතිය :——————————.

08. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————.

09. දකුණු පළාත තුළ ස්ථිර පදිංචි කාලය :——————————.

10. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :——————————.

11. *අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) ඃ*
(I) සමත් වූ වසර/ශ්‍රේණිය :————. වර්ෂය :————.
(II) අ. පො. ස. (සා.පෙළ.) විභාගය :
විභාග අංකය : ———. වර්ෂය :————.

| *විෂයය* | *සමාර්ථය* | *විෂයය* | *සමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(III) අ. පො. ස. (උ.පෙළ.) විභාගය :
විභාග අංකය :————. වර්ෂය :————.

| *විෂයය .* | *සමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————.
13. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර :————.
14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද?:————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් දනිමි.

දිනය :————.

——————.
*අයදුම්කරුගේ අත්සන.*

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ*
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟ වන බවත්, දැනට ..................................................................වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

——————.
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතු ය)

දිනය :————.

09-514

# පළාත් පාලන නිවේදන

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2016.06.01 දින පවත්වන ලද ස්ථාවර කමිටු රැස්වීමේ දී අනුමත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදාල ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතුවන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රාදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසා ද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9-3 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව ප්‍රසිද්ධියට පත්කරනු ලැබේ.

ආර්.එම්.සී.කේ. රාජසුන්දර,
ලේකම්,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2016 ජූනි මස 13 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**මාර්ග විස්තරය**

| දිග | පළල |
|---|---|
| ආරම්භක ස්ථානයේ සිට මීටර් - 55 | අඩි - 10 |
| එතැන් සිට මීටර් - 154 | අඩි - 08 |


| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | කැබැල්ලගොල්ලවත්ත මාර්ගය |
| වසම | :- | වහව |
| ආරම්භය | :- | වහව මීදුම මාර්ගයේ කහඹිලියාගොඩ ඩබ්ලිව්.ජී. තිලකවංශ මහතාගේ නිවස අසලින් |
| අවසානය | :- | එච්.එන්.ජී. සරච්චන්ද්‍ර මහතා ගේ ඉඩම අසලින් |

වහව මීදුම මාර්ගයේ කහඹිලියාගොඩ ඩබ්ලිව්.ජී. තිලකවංශ මහතාගේ නිවස අසලින් ආරම්භව වම්පසින් ඩබ්ලිව්.ජී. තිලකවංශ යන අයට අයත් කැබැල්ලගොල්ලවත්ත, කේ.එම්.එම්. පාලිත යන අයට අයත් කැබැල්ලගොල්ලවත්ත, එල්.ටී. සිරිසෝම යන අයට අයත් කැබැල්ලගොල්ලවත්ත එච්.එන්.ජී. සරච්චන්ද්‍ර යන අයට අයත් කැබැල්ලගොල්ලවත්ත යන ඉඩම්වලින් මායිම්වන්නා වූ ද

දකුණුපසින් ඩබ්ලිව්.ජී. තිලකවංශ යන අයට අයත් කැබැල්ලගොල්ලවත්ත, යූ.ජී. විමලා වීරසිංහ යන අයට අයත් කැබැල්ලගොල්ලවත්ත යන ඉඩම්වලින් මායිම්වන්නාවූ ද කැබැල්ලගොල්ලවත්ත මාර්ගය.

**ඩී. රත්නායක (F. S. I)**
බලයලත් මිනින්දෝරු හා උසාවි කොමසාරිස්
කෑගල්ල.
දුර ඇමතුම 035-2265421

**පිඹුරු අංකය : 6634**



පරිමාණය 1 : 1000

සබරගමුව පළාත

කෑගල්ල දිස්ත්‍රික්කය

කිනිගොඩ කෝරළයේ මල්ලිපොතු පත්තුවේ

කහබිලියා ගම පිහිටි ... මෙහි පෙන්වන

**පිඹුර**

මායිම් :

උතුරට :-
නැගෙනහිරට :-
දකුණට :-
බටහිරට :-

| කැබලි අංකය | අ. රූ. ප. | හෙක්ටයාර් | විස්තරය |
|---|---|---|---|
| A- B | 0-0-06.5 | 0.0164 | ... අඩි 10 ප්‍රවේශ මාර්ගය (දිග මීටර් 55 පළල අඩි 10) |
| B, C, D, E | 0-0-14.6 | 0.0368 | ... මාර්ගය (දිග මී 154, පළල අඩි 8) |
| එකතුව | 0-0-21.6 | | |

ඩී. රත්නායක
බලයලත් මිනින්දෝරු
උසාවි කොමසාරිස්
කෑගල්ල

මනින ලද දිනය : 2016-01-19 ප්‍රමාණය : ...

ඩී. රත්නායක.
බලයලත් මිනින්දෝරු

09-618/1

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර, කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2016.06.29 දින පවත්වන ලද ස්ථාවර කමිටු රැස්වීමේ දී අනුමත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදාළ ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතුවන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රාදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසා ද යන්න සඳහන් කල ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළවන දින සිට දින 30 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපලක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9-3 වගන්තිය ප්‍රකාරව, මා වෙත පැවරී ඇති බලතල අනුව ප්‍රසිද්ධියට පත්කරනු ලැබේ.

ආර්. එම්. සී. කේ. රාජසුන්දර,
ලේකම්,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2016 ජූලි මස 13 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**මාර්ග විස්තරය**

| දිග | පළල |
|---|---|
| අඩි - 356 | අඩි - 08 |


| | | |
|---|---|---|
| මාර්ගයේ නම | :- | සියඹලාගස්තැන්න සිට දියගමුහේන දක්වා මාර්ගය |
| වසම | :- | දීගනකන්ද |
| ආරම්භය | :- | සියඹලාගස්තැන්න ඒ. ආර්. එස්. සෙනවිරත්න මහතාගේ ඉඩම |
| අවසානය | :- | දියගමුහේන |

සියඹලාගස්තැන්න ඒ. ආර්. එස්. සෙනවිරත්න මහතාගේ ඉඩම අසලින් ආරම්භව වම්පසින් ඒ. ආර්. එස්. සෙනවිරත්න යන අයට අයත් හිටිනාවත්ත ඒ. ආර්. ඩී. සෙනවිරත්න යන අයට අයත් සියඹලාගස්තැන්නේ දියගමුහේන, ජී. ජී. ගුණතිලක යන අයට අයත් හිටිනාවත්ත, යන ඉඩම්වලින් ද

දකුණුපසින් ඒ. ආර්. එස්. සෙනවිරත්න යන අයට අයත් හිටිනාවත්ත, ඩී. ජී. චමින්ද ජයතිලක යන අයට අයත් හිටිනාවත්ත. රාජපක්ෂ ආනන්ද සිරිසෝම යන අයට අයත් හිටිනාවත්ත (සියඹලාගස්තැන්න) යන ඉඩම්වලින් මායිම්වන්නා වූ සියඹලාගස්තැන්න සිට දියගමුහේන දක්වා මාර්ගය.

එච්. එම්. ආර්. ටී. කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවිකොමසාරිස් සහ තක්සේරුකරු
අංක 86/04, ජයබිම මාවත
දලුග්ගල, රඹුක්කන
035-2266422
077 4973610
ලි.ප. අංක 19831492

පිඹුරු අංකය. 112 /2016
පෙර පාසල් මාර්ගය සිට
දියකමුව හේන දක්වා පෙර
පාසල් අතුරු මාර්ගය




පරිමාණය 1 - 500
සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බඩ කෝරළයේ ගල්බඩ පත්තුවේ රඹුක්කන ප්‍රා.ලේ කොට්ඨාශයේ රඹුක්කන ප්‍රා.සභා සීමාව තුල දීගනකන්ද ග්‍රා.නි වසමේ කෙම්පිටිකන්ද ගමේ පිහිටි සියඹලාගස්තැන්න හිටිනාවත්ත නැමති ඉඩම (බ.ම්/ඩී. රත්නායක මහතාගේ අංක 1219 දරණ පිඹුරේ කැබලි අංක 08 හා කැබලි අංක 03,04, 06 හා 05 හි කොටස්) හා දියගමුව හේන කොටසක් (දැනට ප්‍රවේශ මාර්ගය) දැනට භූමියේ දැක්වෙන මායිම් අනුව මැන සාදන ලද.

පිඹුර

මායිම් - ඉහත පිඹුරේ දැක්වෙන පරිදි වේ.

සම්පූර්ණ බිම්ප්‍රමාණය

| කැබලි අංක | හෙක්ටයාර් | අ | රූ | පර්චස් |
|---|---|---|---|---|
| 01 | 0.032122 | 0 | 0 | 12.70 |

දිග අඩි 370 යි අවම පළල අඩි 08යි

මැනීම: 2016-05-04

2016-05-04
එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලමිතිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
ටෙලි : 035-2266422/077 4973610
ලි.ප. අංකය: 19831492

09-618/2

## මහනුවර මහා නගර සභාව

### 1975 අංක 04 දරන විථි නම් කිරීම ස්මාරක ඉදි කිරීම හා පාලනය කිරීමේ පනත යටතේ ''අරලිය මාවත'' නම් කිරීම

2015.09.29 වැනි දින පැවැති මහ සභා රැස්වීමේ දී 8(49) දරන සභා සම්මුතියට අනුව විථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

02. (252 වැනි අධිකාරය වන) මහ නගර සභා අඥාපනතේ 7(11) යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 04 දරන විථි නම් කිරීම, ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි මධ්‍යම පළාතේ පළාත් සභාවේ මහ ඇමතිතුමා විසින් ලබා දෙන ලද අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත ''අරලිය මාවත'' යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

චන්දන තෙන්නකෝන්,
නාගරික කොමසාරිස්, මහනුවර,

2016 අප්‍රේල් මස
මහනුවර නාගරික කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

| | | |
|---|---|---|
| 01. | පළාත් පාලන ආයතනයේ නම | - මහනුවර මහා නගර සභාව |
| 02. | දිස්ත්‍රික්කය | - මහනුවර |
| 03. | විථියේ වර්තමාන නම | - නැත |
| 04. | අළුතින් යොදා ඇති නම | - ''අරලිය මාවත'' |
| 05. | මාර්ග විස්තරය | - සියඹලාගස්තැන්න පටුමග අංක 01 මාවත සමීපයෙහි පිහිටි අංක 24/39 දරන නිවස අසලින් උක්ත පටුමග සිට ජගත් රත්නායක මහතාගේ නිවාසය දක්වා දිවෙන මෙම මාර්ගය |

09-729

---

## තුම්පනේ ප්‍රාදේශීය සභාව

### ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ නිවේදනය

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත**

201 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 4 වැනි වගන්තියේ (i) වන උප වගන්තියෙන් පැවැරී ඇති බලතල ප්‍රකාරව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 (03) උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. ඩී. පතිරණ,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2016 ජූලි මස 11 වැනි දින.

*තීරණය*

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (i) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (i) වැනි උපවගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2013.06.28 දින අංක 1816/42 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙම තීරණය *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමි.

09-701

## මහර ප්‍රාදේශීය සභාව

### 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9.3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව වර්ෂ 2016 ක් වූ අගෝස්තු මස 04 වැනි දින අංක 485 යටතේ පහත සඳහන් තීරණ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1888/47 හා 2014.11.14 වැනි දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා අනුශංගික විධිවිධාන පනතේ 2 වන වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලදුව ඒ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 හා 2015.12.28 දිනැති ගැසට් පත්‍රය යටතේ නිවේදනය කර ඇත.

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව එකී සම්මත අතුරු ව්‍යවස්ථා මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017.01.01 වැනි දින සිට අදාළ විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ තීරණය කරමි.

තව ද, මෙම තීරණය ගනු ලබන මෙදින වන විට මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ අදාළ කර ගනිමින් බලාත්මක වන පහත උපලේඛනගත නාමයන් යටතේ විස්තර කරන සම්මත අතුරු ව්‍යවස්ථා, එම සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ එතෙක් ගනු ලබන ක්‍රියා මාර්ගයන්ට අගතියක් නොවන පරිදි 2016.12.31 වැනි දිනෙන් පසුවට මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා අදාළ නොවිය යුතු බවට ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තීරණය කරමි.

එස්.ඒ.කේ.එන්.ඉන්ද්‍රජිත්,
ලේකම් හා සභාවේ බලතල කාර්ය
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2016 අගෝස්තු මස 04 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව.

#### ඉහත කී උපලේඛනය

1. බේකරි
2. අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම
3. හෝටල්
4. ලැගුම් නිවාස
5. මාළු විකිණීම
6. සංචාරක වෙළෙන්දෝ
7. ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය
8. ප්‍රසිද්ධ පිට්ටනි පාවිච්චියට ගැනීම
9. මස් විකිණීම

09-703

---

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව

### වැලිගම නගර සභාව

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරිය) 184 "අ" වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර වැලිගම නගර සභාවේ ලේකම් චන්ද්‍රා අබේගුණවර්ධන වන මා 2016.05.09 දිනැති තීරණ අංක 1090 යටතේ පහත උපලේඛන I හි දක්වා ඇති ඉහත නම් සඳහන් අතුරු ව්‍යවස්ථාව වැලිගම නගර සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

චන්ද්‍රා අබේගුණවර්ධන,
ලේකම්,
වැලිගම නගර සභාව.

2016 ජූලි මස 29 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේ දී ය,

#### උපලේඛන

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන ) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු, 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දකුණු පළාතේ , පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013.10.25 වැනි දින අංක 1834 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දකුණු පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යංශයේ ලේකම් විසින් අංක 1886/12 හා 2014 ඔක්තෝබර් මස 28 දිනැති iv (අ) වැනි පළාත් සභා ගැසට් නිවේදනය ප්‍රකාරව එම නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබූ නගර සභා බලප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව සහ මදුරුවන් හා රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වැලිගම නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව තීරණය කරමි.

09-517

## 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

### කල්පිටිය ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව කල්පිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් කංකානිගේ ප්‍රදීප් චන්දන කුමාර වන මම ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා බලාත්මකව ක්‍රියාත්මක විය යුතු බවට 2016/08/25 දිනැති අංක 1165 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ලේකම්,
බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (I) වන උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.09.25 වැනි දින අංක 1933/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ පළකරනු ලැබුවා වූ ඝණඅපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා බලාත්මකව ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

09-654

---

## පළාත් පාලන නිවේදන

### යටියන්තොට ප්‍රාදේශීය සභාව

යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් ආර්. එම්. ඒ. රත්නායක වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වන වගන්තියත් සමග කියවිය යුතු එම පනතේ 139 වන වගන්තියෙන් මට පැවරී ඇති බලතල අනුව යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් වශයෙන් 2016 වර්ෂයට අදාළව වාර වාර්තා ලබා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නියමය කිරීමට වූ තීරණය වර්ෂ 2016 ක් වූ මැයි මස 02 වැනි දින තීරණ අංක 701 යටතේ ගන්නට යෙදුන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. ඒ. රත්නායක,
ලේකම්,
යටියන්තොට ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 10 වැනි දින,
යටියන්තොට ප්‍රාදේශීය සභාවේ දී ය.

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපලක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකල ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා එකී යම් දේපලක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුළිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි එකී පනතේ 9 ව වගන්තියේ (3) වන උප වගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මම මෙයින් තීරණය කරමි.

09-513

---

## 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

### කල්පිටිය ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව කල්පිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් කංකානිගේ ප්‍රදීප් චන්දන කුමාර වන මම ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, ආදාහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථා කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා බලාත්මකව ක්‍රියාත්මක විය යුතු බවට 2016/08/25 දිනැති අංක 1164 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ලේකම්,
බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (I) වන උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.08.31 වන දින අංක 1930//6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශෙෂ) *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබුවා වූ ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, ආදාහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථා 1952 අංක 06 දරන පළාත් පාලන අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා බලාත්මකව ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

09-655

---

# විවිධ දැන්වීම්

## වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව

### ගොඩනැගිලි ඉදිකිරීමේ අවසරය සහ එයට ගාස්තු අයකිරීම

1987 වසරේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21,78 යන පරිච්ඡේදය යටතේ 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 4 වන B කොටස යටතේ ගරු පළාත් පාලන අමාත්‍යතුමා විසින් පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ අට වන වගන්තිය ප්‍රකාර යාපනය දිස්ත්‍රික්කයේ චුන්නාකම්, වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ 2016.07.13 දිනැති අංක 2 දරන පරිපාලන නියෝගයට අනුව වලිකාමම් දකුණ බල ප්‍රදේශය තුළ සෑදීමට අදහස් කරන ලද ගොඩනැගිලිවලට අනුමැතිය හා පිරික්සුම් ගාස්තු ද අනවසරයෙන් දැනට ඉදිකර ඇති ගොඩනැගිලිවලට දඩුවම් ගාස්තු ද, 2016.08.01 වැනි දින සිට පහත උපලේඛනයේ 1 සහ 2 හි සඳහන් පරිදි අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් ප්‍රසිද්ධියේ දන්වා සිටිනු ලැබේ.

ලේකම්,
වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය අංක 01**

| | බිම් ප්‍රමාණය | වාසස්ථාන සඳහා රු. ශත | වෙනත් භාවිතයන් සඳහා රු. ශත |
|---|---|---|---|
| 1. | වර්ග අඩි 1 සිට 500 දක්වා | 300.00 | 400.00 |
| 2. | වර්ග අඩි 501 සිට 1,000 දක්වා | 350.00 | 600.00 |
| 3. | වර්ග අඩි 1,001 සිට 2,000 දක්වා | 450.00 | 1,100.00 |
| 4. | වර්ග අඩි 2,001 සිට 3,000 දක්වා | 1,100.00 | 2,000.00 |
| 5. | වර්ග අඩි 3,001 සිට 5,000 දක්වා | 1,900.00 | 2,750.00 |
| 6. | වර්ග අඩි 5,001 සිට 7,500 දක්වා | 2,200.00 | 3,500.00 |
| 7. | වර්ග අඩි 7,501 සිට 10,000 දක්වා | 2,600.00 | 4,000.00 |
| 8. | වර්ග අඩි 10,000 ට වැඩි සෑම වර්ග අඩි 100 කටම | 35.00 | 40.00 |

**උපලේඛනය 02**

ගොඩනැගිලි ඉදිකිරීමේ අවසරපත් නොලැබ ප්‍රාදේශීය සභා නීතිරීතිවලටද ප්‍රමාණයට අනුව ද ගොඩනැගිලි ඉදිකර එය විධිමත්ව හසුරවා (සකස් කර) ගොඩනැගිලිවලට ද අවසර දීම සඳහා වන දඩමුදල් පහත සඳහන් වේ.

| *ගොඩනැගිලිවල තත්වය* | *බිම් මහලේ එක් වර්ග අඩියකට රු. ශත* | *උඩුමහලේ එක් වර්ග අඩියකට රු. ශත* |
|---|---|---|
| 1. අත්තිවාරම පමණක් සම්පූර්ණ කල ගොඩනැගිලි | 5.00 | |
| 2. වහල මට්ටම (වහල නොමැතිව) | 10.00 | 10.00 |
| 3. වහල සම්පූර්ණ කල | 15.00 | 15.00 |
| 4. මුළු ගොඩනැගිල්ලම සම්පූර්ණ කල | 20.00 | 20.00 |
| 5. තාප්ප බැඳීම සඳහා එක් අඩියකට | 5.00 | |

ලේකම්,
වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව.

09-519

---

## ලංකාපුර ප්‍රාදේශීය සභාව

### විශේෂ කසල ශෝධන බද්ද පැනවීම

1987 වසරේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 (ඇ) වගන්තිය යටතේ ගරු පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමාගේ අනුමැතිය ඇතිව පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයට යටත්ව සම්මත අතුරු ව්‍යවස්ථාවේ 9 වැනි වගන්තිය ප්‍රකාරව ලංකාපුර ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් නගරයන්හි කසල ශෝධන සේවයෙන් ප්‍රයෝජනය ලබන දේපල වෙනුවෙන් එහි සඳහන් ගාස්තු 2016 වර්ෂයේ සිට මාසිකව, නැවත සංශෝධනය කරන තුරු පනවා අය කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

කේ. එම්. කමලාවතී මැණිකේ,
ලේකම්,
ලංකාපුර ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 24 වැනි දින,
ලංකාපුර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

1. තල්පොත, තඹාල, පුලස්තිගම, සුංගාවිල, පන්සල්ගොඩැල්ල යන නගර සීමාවන් තුළ පිහිටි කසල ශෝධනයෙන් ප්‍රයෝජනය ලබන දේපල,

2. බැහැර කරනු ලබන කසල ප්‍රමාණය අනුව එක් වර්ෂයක් සඳහා රු. 5,000 නොවැඩි වූ ගාස්තුවක්.

09-504

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සඳහා බදු අය කිරීම - 2017 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(2) වැනි උප වගන්තිය යටතේ ඇතැම් වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සඳහා බදු අය කිරීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ යම් බලපත්‍ර ගාස්තුවක් හෝ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නා වූ ව්‍යාපාර හෝ වෘත්තීන් සම්බන්ධයෙන් එකී ව්‍යාපාරයේ හෝ වෘත්තියේ බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂයේ ආදායම අනුව නියම කරන පහත දැක්වෙන බදු ප්‍රමාණයන් 2017 වර්ෂය සඳහා ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 09 (03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 වැනි දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පල්ලේපොල.

පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

**ව්‍යාපාර බද්ද**

***යෝජනාව***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ -

*(අ)* (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පල්ලේපොල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ මෙහි පහත උපලේඛනයේ 1 වන කොටසේ නිරූපිත යම් ව්‍යාපාරයක් 2017 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු මත එකී ව්‍යාපාරයේ 2017 වර්ෂයේ ආදායම දෙවන කොටසේ (1) වන තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක දෙවන තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණ අනුව වූ බද්දක් පනවා අයකිරීමට ; සහ

*(ආ)* (2) වන උපලේඛනයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්ද යටතේ සෑම තැනැත්තෙකු විසින් කර්මාන්ත බද්ද 2017 වර්ෂයේ අප්‍රේල් මස පළමුවන දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි නියම කිරීමට පල්ලේපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*උපලේඛනය*

**පළමුවන කොටස**

*ව්‍යාපාරය :*

01. තොග බඩු ගබඩා
02. ගෘහ භාණ්ඩ වෙළඳසැල්
03. ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කිරීම විකිණීම
04. පුද්ගලික සති පොලක්
05. කුකුළු ගොවිපල (සතුන් 50ට වැඩි)
06. බැටළුවන් ඌරන් එළුගවයන් ගොවිපල (සතුන් 10ට වැඩි)
07. තලාතු මිනිරන් (මයිකා) ශුද්ධ කිරීමේ ස්ථාන
08. කොහු මෝල්
09. යාන්ත්‍රික වී මෝල්
10. රියදුරු පුහුණු ආයතන
11. ආහාර තොග ගබඩාව
12. පරිගණක පුහුණු ආයතන
13. ව්‍යාපෘති උපදේශක ආයතන
14. උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථාන
15. වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනය
16. ප්‍රචාරක ආයතන
17. වාහන සේවා ස්ථාන
18. ලැගුම්හල්
19. භාණ්ඩ අපනයන මධ්‍යස්ථාන
20. මිනිස් ශ්‍රමබල සැපයුම් ස්ථාන
21. වාහන අලෙවිකරන ස්ථාන (යතුරු පැදි ඇතුළුව)
22. විදේශ රැකියා නියෝජිත ආයතන
23. දේශීය හා විදේශීය වන්දනා චාරිකා සංවිධාන ආයතන
24. උකස් මධ්‍යස්ථාන
25. බැංකු/මූල්‍ය ආයතන
26. බඩු විකුණන ඒජන්තවරුන්
27. කොමිස් ඒජන්තවරු
28. කොන්ත්‍රාත්කරුවන්
29. කුළී රථ හිමියන්
30. ඉන්ධන පිරවුම් හල්
31. ගණන් පරීක්ෂකවරු /ගණකාධිකාරිවරු
32. ගෑස් ගබඩා
33. පෞද්ගලික පංති
34. බ්‍රෝකර්වරු
35. රථබීම හල්
36. යන්ත්‍රෝපකරණ බර වාහන කුළියට දෙන ස්ථාන
37. රක්ෂණ ආයතන
38. ලොතරැයි ආයතන
39. වෙන්දේසිකරුවන්
40. කර්මාන්ත ශාලා
41. දුරකතන සන්නිවේදන කුළුණු
42. යාන්ත්‍රික ලී මෝල් සහ ලී ගබඩා.
43. සිමෙන්ති වැඩපල

**දෙවන කොටස**

| *1 වැනි තීරය* | *11 වැනි තීරය* |
|---|---|
| *2016 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම :* | *රු. ශත* |
| (i) රු. 6,000 නොඉක්මවූ විට | කිසිවක් නැත |
| (ii) රු. 6,000 -රු. 12,000 අතර වන විට | 90 0 |
| (iii) රු. 12,000 -රු. 18,750 අතර වන විට | 180 0 |
| (iv) රු. 18,750 - රු. 75,000 අතර වන විට | 360 0 |
| (v) රු. 75,000 - රු. 1,50,000 අතර වන විට | 1,200 0 |
| (vi) රු. 1,50,000 ඉක්මවන විට | 3,000 0 |

09-684/6

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

### 2017 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු ගම් ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති කොටසේ පිහිටි නිශ්චල දේපළවලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වැනි වගන්තිය ප්‍රකාර වාර්ෂික වටිනාකමින් සියයට පහක (5%) වරිපනම් බද්දක් 2017 වර්ෂය සඳහා පනවා 2017 වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වන අයුරු කාර්තු හතරකින් අය කර ගැනීමට හා එකී කාර්තුව අවසාන වීමට පෙර අවසාන බදු මුදල් ගෙවිය යුතු බවටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(3) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 වැනි දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

තව ද, එකී පනතේ 134 (7) වැනි වගන්තිය ප්‍රකාර වාර්ෂික බදු මුදල් පනතේ සඳහන් වන පරිදි සම්පූර්ණයෙන්ම ගෙවූ විට පහත දැක්වෙන පරිදි වට්ටම් ප්‍රදානය කරන බවට දැනුම් දෙනු ලැබේ.

2017 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බද්ද ගෙව්වහොත් එසේ ගෙවන මුදලින් සියයට දහයක් (10%),

බදු මුදල කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමු මාසය තුළ ගෙව්වහොත් එසේ ගෙවන මුදලින් සියයට පහක් (5%),

තව ද, ඉහත පනවන ලද බද්ද නොගෙවන අවස්ථාවක දී ප්‍රාදේශීය සභා පනතේ 161 වැනි වගන්තිය ප්‍රකාර 10%ක වරෙන්තු ගාස්තුවක් අයකරන බව ද නිවේදනය කරමි.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පල්ලේපොල.

පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

09-684/1

---

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

### විනෝද බදු ආඥාපනත - 2017 වර්ෂය

විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ අලෙවි කරනු ලබන ටිකට් පත්වල මුළු වටිනාකමින් සියයට 10ක විනෝද බද්දක් අය කළ යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 09 (03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 වැනි දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පල්ලේපොල.

පල්ලේපොල ප්‍රාදේශීය සභාව.

09-684/5

---

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

### බදු අය කිරීම - 2017 වර්ෂය

පල්ලේපොල ප්‍රාදේශීය සභාව පහත සඳහන් සේවාවන් සඳහා ගාස්තු අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 (03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 වැනි දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ. මෙම ගාස්තු අය කිරීම 2017.01.01 වැනි දින සිට ක්‍රියාත්මක කරනු ලැබේ.

| | | රු. ශත |
|---|---|---|
| 01. | විරී රේබා සහ නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම | 750 0 |
| 02. | ගොඩනැගිලි සහතික නිකුත් කිරීම (ගම්බද) | 1,000 0 |
| | ගොඩනැගිලි සහතික නිකුත් කිරීම (නගරබද) | 2,000 0 |
| 03. | උද්ධෘත සාරාංශ පෝරම | 25 0 |
| 04. | යකඩ පුටු කුළියට දීම (එක් පුටුවකට දිනකට) | 5.00 |
| 05. | ගොඩනැගිලි සඳහා වර්ග ප්‍රමාණයට අය කිරීම | |
| | ගම්බද ප්‍රදේශය (වර්ග අඩි 01 ක් සඳහා ) | 2 0 |
| | නගරබද (වර්ග අඩි 1ක් සඳහා) | 5 0 |
| 06. | ජල අයදුම්පත් | 100 0 |
| 07. | ඉහල මාලය කුළියට දීම (එක් දිනකට) | 1,200 0 |
| 08. | බැනර් ප්‍රදර්ශනය සඳහා අය කිරීම | |
| | (i) තාවකාලික දැන්වීම් පුවරු වර්ග අඩි 01 ට | 35 0 |
| | (ii) ස්ථාවර දැන්වීම් පුවරු (වර්ෂයකට ) | |
| | වර්ග අඩි 30 දක්වා (වර්ග අඩි 01ට ) | 75 0 |
| | වර්ග අඩි 30ට වැඩි (වර්ග අඩි 01ට) | 75 0 |
| | ප්‍රදීපන දැන්වීම් පුවරු (වර්ග අඩි 01ට) | 90 0 |
| 09. | ගොඩනැගිලි සහතික කාලය දීර්ඝ කිරීම | 350 0 |
| 10. | අනුකූලතා සහතික නිකුත් කිරීම | 500 0 |
| 11. | අනුබෙදුම අනුමත කිරීමේ ගාස්තු | 500 0 |
| 12. | තාවකාලික ප්‍රවාහන බලපත්‍ර මසකට | 1,000 0 |
| 13. | ටෙන්ඩර් පෝරම - රු. 5,00,000 දක්වා | 400 0 |
| | රු. 5,00,000 ට වැඩි | 1,500 0 |
| 14. | ඉඩම් කට්ටි කිරීමේ දී පරීක්ෂා කිරීමේ ගාස්තු (කට්ටියකට) | 500 0 |
| 15. | නල ළිං තැන්පත් වර්ෂයකට | 500 0 |

| | | රු. ශත |
|---|---|---|
| 16. | ප්ලාස්ටික් ටැංකිය කුළියට දීම | 200 0 |
| 17. | ජලය විකිණීම ලීටර් 1.000ක් | 500 0 |
| 18. | පුස්තකාල තැන්පත් | 100 0 |
| | පුස්තකාල සාමාජික අලුත්කිරීම | 25 0 |
| 19. | ප්ලාස්ටික් පුටු 1කට | 10 0 |
| 20. | රථවාහන නැවතුම්පලවල් තාවකාලික වාහන නැවතුම් සඳහා | 50 0 |
| 21. | නගරයේ වාහන නැවතුම් සඳහා | 20 0 |
| 22. | රථ ගාල කුළියට දීම එක් දිනකට | 2,000 0 |
| 23. | බවුසරය කුළියට දීම (ජලය හා ප්‍රවාහනය සමඟ) | |
| | (i) පල්ලේපොල නගර සීමාව තුළ | 3,000 0 |
| | (ii) පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ | 3,500 0 |
| | (iii) පල්ලේපොල බල ප්‍රදේශයෙන් පිටත වැඩිවන කි. මී. 1කට | 200 0 |
| 24. | (i) බැකෝ යන්ත්‍රයට මී. පැ. 1ට | 2,500 0 |
| | (ii) මාර්ග තලන යන්ත්‍රයට මී. පැ. 1ට | 3,500 0 |
| | (iii) කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය දිනකට (පැය 8) | 3,500 0 |
| | (iv) ලොරි රථය ඉන්ධන සමග දිනකට (පැය 8) | 6,750 0 |
| | * වැඩිවන සෑම පැය 1කටම | 800 0 |
| | * නවතා තැබීමට | 50 0 |
| | * පළමු කි. මී. 05 ඇතුළත | 1,500 0 |
| | * අතිරේක කි. මී. 1කට | 200 0 |
| | (v) ටිපර් රථය : | |
| | * ඉන්ධන සමග දිනකට(පැය 8) | 12,000 0 |
| | * අතිරේක පැයකට | 1,500 0 |
| | * නවතා තැබීමට | 50 0 |
| | * පළමු කි. මී. 05 ඇතුළත | 3,000 0 |
| | * අතිරේක කි. මී. 1 කට | 400 0 |
| | (vi) ට්‍රැක්ටරය : | |
| | * ඉන්ධන සමග දිනකට (පැය 8) | 6,500 0 |
| | * අතිරේක පැයකට | 800 0 |
| | * නවතා තැබීමට | 50 0 |
| | * පළමු කි. මී. 05 ඇතුළත | 1,000 0 |
| | * අතිරේක කි. මී. 1 කට | 200 0 |
| | (vii) වතුර පොම්පය | |
| | * ඉන්ධන සමග දිනකට (පැය 8) | 2,000 0 |
| | * අතිරේක පැයකට | 250 0 |
| 25. | ක්‍රීඩාපිටිය කුළියට දීම (එක් දිනකට) | 2,000 0 |
| 25. | වයිබ්‍රේටින් ගල්රෝල ඉන්ධන ඇතුළුව කම්පන සහිතව යන්ත්‍ර පැයකට | 4,500 0 |

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පල්ලේපොල.

පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

09-684/8

---

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

### අන්තරාදායක හා අප්‍රසන්න වෙළඳ ව්‍යාපාර

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත් කර ඇති පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 21 වැනි කාණ්ඩයේ 1 වැනි ඡේදයේ විධිවිධාන ප්‍රකාර පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන වෙළඳ ව්‍යාපාර අන්තරාදායක හා අප්‍රසන්න වෙළඳ ව්‍යාපාර වශයෙන් ප්‍රකාශයට පත් කිරීමටත්, එකී ව්‍යාපාර වලින් බදු හා බලපත්‍ර ගාස්තු අය කිරීමටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 09(03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 වැනි දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පල්ලේපොල.

පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### උපලේඛනය

*අන්තරාදායක ව්‍යාපාර :*

1. කඹුක් බොරළු හෝ කළු ගල් තැනීම
2. කඹුක් බොරළු හෝ කළුගල් ගබඩා කිරීම
3. ග්‍රොස් 1ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩා කර තබා ගැනීම
4. කොප්පරා නිෂ්පාදනය කිරීම් සකස් කිරීම් හෝ ගබඩා කර තබා ගැනීම
5. ගැලුම් 50ට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩා කර තබා ගැනීම
6. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
7. ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම
8. තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම

9. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
10. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම
11. කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම
12. ධාන්‍ය හෝ මාංශ භෝග හොන්ඩර 5ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
13. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම
14. යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
15. අතින් ලී ඉරණ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම
16. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
17. දර ගබඩාවක් පවත්වාගෙන යාම
18. හිරිගල් හෝ හුණුගල් සඳහා හැරීම
19. යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන හෝ නොකෙරෙන කම්හලක් පවත්වාගෙන යාම
20. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොන්ඩර කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
21. හිස් බෝතල් හා හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම
22. බයිසිකල් හෝ මෝටර් බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම
23. විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
24. මැසූ ඇඳුම් නිෂ්පාදනය
25. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම

### *II වැනි කොටස*

*අප්‍රසන්න ව්‍යාපාර :*

26. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
27. හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
28. හම් ගබඩා කර තබා ගැනීම
29. කුකුළන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම
30. බැටළුවන් එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා හෝ ගාලක් පවත්වාගෙන යාම
31. පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම
32. පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
33. තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග ගබඩා කර තබා ගැනීම
34. කරවල ලුණු මාළු හෝ ජාඩි හොන්ඩර 3ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම
35. සිමෙන්ති හොන්ඩර 25ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
36. දුම්කොල සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම
37. සත්ත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම
38. පුන්නක්කු ටොන් 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම
39. සබන් නිෂ්පාදනය කිරීම
40. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම
41. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
42. වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
43. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම
44. සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම
45. රස කැවිලි වර්ග නිපදවීම
46. පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම
47. රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
48. හුණු ගල් හෝ හුණු ගබඩා කර තබා ගැනීම
49. පැණි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
50. කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම
51. කෝපි ධාන්‍ය වර්ග, මාංශ බෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම
52. යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය වර්ග මාංශ භෝග කෙටීම
53. ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
54. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
55. ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම
56. සෙල්ලම් බඩු නිපදවීම
57. ශීත කළ මස්, මාළු ගබඩා කර තැබීම
58. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
59. දිය ලුණු, සුදු(වයිටිං) හුණු හෝ හිරිගල් නිපදවීම
60. එනසාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වියලීම

### *III වැනි කොටස*

*අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර :*

61. තලාතු මිනිරන් ශුද්ධ කිරීම
62. ඩ්‍රයි ක්ලීන් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම
63. රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම
64. විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
65. හුණු පිළිස්සීම හෝ සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම
66. ගිණි කෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
67. බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම
68. වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
69. මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම
70. බෙලෙක් වැඩ පලක් පවත්වාගෙන යාම
71. ගල් ස්මාරක නිපදවීම
72. පෙට්‍රල්, ඩීසල් තෙල් හෝ වෙනත් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
73. පෙට්‍රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
74. කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
75. වීදුරු භාණ්ඩ නිපදවීම
76. වීදුරු කැටපත් නිපදවීම

77. යකඩ, තඹ තහඩු ගැල්වනයිස් කිරීම
78. වායු සමනය කළ යන්ත්‍ර ශීතකරණ හෝ අධි ශීතකරණ නිපදවීම සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම
79. රබර් කැවුණු කෙඳි වර්ග නිපදවීම
80. ඊයම් බැටරි චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
81. විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යාම
82. පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තැබීම

09-684/7

---

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

### බලපත්‍ර ගාස්තු පැනවීම

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර පල්ලේපොල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2017 වර්ෂයේ කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වැනි තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත් වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනු ප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි පල්ලේපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*ව්‍යාපාර පිළිබඳ බදු හා බලපත්‍ර ගාස්තු*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 149 වැනි වගන්තිය යටතේ මෙහි පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපාරයක් සඳහා බද්දක් එම ව්‍යාපාරය කරගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව 2017.01.01 දින සිට බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් අංක 09 (03) අනුව මාහට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ. උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු 2017 මාර්තු මස 31 දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බව ද දැනුම් දෙනු ලැබේ.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පල්ලේපොල.

*උපලේඛනය*

| | *I වැනි තීරය* කර්මාන්තය | *II වැනි තීරය* පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | *රු. 750 0 දක්වා* | *රු. 750 0 සිට රු. 1,500 0 දක්වා* | *රු. 1,500 0 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | තේ කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 700 0 | 800 0 |
| 02. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | බේකරියක් සඳහා | 475 0 | 750 0 | 900 0 |
| 04. | ශීත කළ කුකුල් මස්, ඌරු මස්, එළු මස් කඩ | 475 0 | 750 0 | 1,000 0 |
| 05. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 900 0 |
| 06. | සමාජ ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 07. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 |
| 08. | මස් විකිණීමේ කඩයක් පවත්වාගෙන යාම | | | |
| | (1) ගව මස් කඩයක් | 500 0 | 700 0 | 1,000 0 |
| | (2) එළු මස් කඩයක් | 500 0 | 600 0 | 900 0 |
| | (3) කුකුල් මස් කඩයක් | 500 0 | 700 0 | 1,000 0 |
| 09. | සංචාරක වෙළඳාම සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 10. | මුහුදු මාළු, වැව් මාළු කඩයක් සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 11. | රූපලාවන්‍යාගාර සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 12. | රස කැවිලි නිෂ්පාදන කරන ස්ථාන සඳහා | 450 0 | 700 0 | 800 0 |

**කර්මාන්ත බදු පැනවීම**

***යෝජනාව***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර ඃ

*(අ)* පල්ලේපොල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ 2017 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2017 වර්ෂයේ දී පනවා අයකිරීමට ;

*(ආ)* 2016 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථෝක්ත බද්ද 2017 අප්‍රේල් මස පළමුවන දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට පල්ලේපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*උපලේඛනය*

| I වැනි තීරය<br>කර්මාන්තය | | II වැනි තීරය<br>පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. 750 දක්වා<br>රු. ශත | රු. 750 සිට රු. 1,500 දක්වා<br>රු.ශත | රු. 1,500 ට වැඩි<br>රු.ශත |
| 01. | සිල්ලර කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | සාප්පු බඩු කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 700 0 | 900 0 |
| 03. | ඡායාරූප ශාලාවක් සඳහා | 450 0 | 700 0 | 850 0 |
| 04. | පළතුරු කඩයක් සඳහා | 400 0 | 600 0 | 800 0 |
| 05. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | එළවළු කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 |
| 07. | යකඩ කම්මලක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 850 0 |
| 08. | වී මෝලක් පවත්වාගෙන යාම (එච්. පී. 20 දක්වා) | 450 0 | 600 0 | 850 0 |
| 09. | බැටරි චාජ් කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 10. | කළුගල් වලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | මිරිස්, ධාන්‍ය ඇඹරුම් හලක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 900 0 |
| 12. | පාපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් සඳහා | 450 0 | 600 0 | 800 0 |
| 13. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 900 0 |
| 14. | හුණු ගබඩාවක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 900 0 |
| 15. | මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 450 0 | 700 0 | 1,000 0 |
| 16. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 17. | වෑල්ඩිං වැඩපලක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 18. | රෙදිපිළි සාප්පුවක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 800 0 |
| 19. | වෑල්ඩිං වැඩපලක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 20. | රෙදිපිළි සාප්පුවක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 880 0 |
| 21. | කෘෂිනාශක, රසායනික පොහොර කඩයක් සඳහා | 450 0 | 700 0 | 800 0 |
| 22. | දුම්කොළ උදුනක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 23. | දුම්කොළ කුඩු වේලීමේ ස්ථානයක් සඳහා | 400 0 | 700 0 | 1,000 0 |
| 24. | පින්තූර රාමු කරන ස්ථානයක් සඳහා | 400 0 | 600 0 | 800 0 |
| 25. | පාසල් උපකරණ හා පොත් සාප්පුවක් සඳහා | 400 0 | 700 0 | 900 0 |
| 26. | ඇඳුම් මැසීමේ ස්ථානයක් සඳහා | 450 0 | 750 0 | 1,000 0 |
| 27. | ඔර්ලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් සඳහා | 450 0 | 700 0 | 900 0 |
| 28. | බුලත්, පුවක් කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 |
| 29. | කොප්පරා වේලන ස්ථානයක් සඳහා | 400 0 | 600 0 | 800 0 |
| 30. | සිමෙන්ති හො. 25ට වැඩි ගබඩාවක් සඳහා | 400 0 | 700 0 | 1,000 0 |
| 31. | කොකෝවා, වියළි පැපොල් කිරි ගබඩාවක් සඳහා | 400 0 | 700 0 | 1,000 0 |

| I වැනි තීරය<br>කර්මාන්තය | II වැනි තීරය<br>පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|
| | *රු. 750 දක්වා රු. ශත* | *රු. 750 සිට රු. 1,500 දක්වා රු.ශත* | *රු. 1,500 ට වැඩි රු.ශත* |
| 32. තැඹිලි, කුරුම්බා කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 800 0 |
| 33. රූපවාහිනි, ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා | 400 0 | 600 0 | 800 0 |
| 34. සුරුට්ටු, බීඩි නිෂ්පාදනය කිරීම සඳහා | 400 0 | 550 0 | 750 0 |
| 35. වළං කඩයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 775 0 |
| 36. ශබ්ද විකාශන යන්ත්‍ර අලුත්වැඩියාව | 450 0 | 600 0 | 800 0 |
| 37. මහන මැෂින්, විදුලි ගෘහ උපකරණ සාප්පුවක් පවත්වාගෙන යාම | 400 0 | 700 0 | 900 0 |
| 38. ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 800 0 |
| 39. සමුපකාර ප්‍රාදේශිකයක් පවත්වාගෙන යාම | 450 0 | 750 0 | 1,000 0 |
| 40. පොල් ලී මඩුවක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 41. පාපැදි අමතර කොටස් අලෙවිසැල | 450 0 | 650 0 | 800 0 |
| 42. යතුරුපැදි ත්‍රීරෝද රථ අමතර කොටස් වෙළඳ සැල සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 43. යතුරුපැදි අළුත්වැඩියා කරන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 800 0 |
| 44. කුළු බඩු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 45. බීරළු කැටයම් කපන ස්ථානයක් සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 46. රබර් වේලන උඳුනක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 47. පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම | 475 0 | 600 0 | 800 0 |
| 48. හුණු පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 49. අයිස් ක්‍රීම් නිෂ්පාදනය කිරීම සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 50. කුඹල් කර්මාන්තය සඳහා | 500 0 | 600 0 | 800 0 |
| 51. ආයුර්වේද බෙහෙත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 900 0 |
| 52. මිනී පෙට්ටි සෑදීම/ ගබඩා කිරීම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 53. අවමංගල මල් ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 54. ටෙලිකොමියුනිකේෂන් ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. කැසට් සීඩී වීසීඩී තැටි අලෙවි සැල සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 56. සිමෙන්ති ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය/ අලෙවිය සඳහා | 500 0 | 700 0 | 1,000 0 |
| 57. ටයර් ටියුබ් කඩයක් සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 58. ටයර් ටියුබ් කඩයක් සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 59. ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 60. තේ කුඩු පැකට් කර විකිණීම | 500 0 | 700 0 | 1,000 0 |
| 61. නිවාස සැලසුම් ඇඳීම | 500 0 | 600 0 | 700 0 |
| 62. කිරි මුදවීම, යෝගට් නිෂ්පාදනය සඳහා | 500 0 | 700 0 | 850 0 |
| 63. කඩල, මුරුක්කු පැකට් කර විකිණීම | 500 0 | 700 0 | 800 0 |
| 64. ඉදල් කොසු බුරුසු නිෂ්පාදනය | 500 0 | 700 0 | 850 0 |
| 65. බිම්මල් වගාව සඳහා | 500 0 | 600 0 | 750 0 |
| 66. ජ්‍යොතිෂ්‍ය කටයුතු කරන ස්ථානයක් | 500 0 | 750 0 | 900 0 |
| 67. සුරතල් මත්ස්‍යයින්/මාළු ටැංකි වෙළඳාම | 500 0 | 700 0 | 850 0 |
| 68. මිරිදිය මත්ස්‍ය වගාව | 500 0 | 700 0 | 1,000 0 |
| 69. ගිනිකෙළි භාණ්ඩ වෙළඳාම | 500 0 | 700 0 | 1,000 0 |
| 70. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 71. දියලුණු පැකට් කරන ස්ථානයක් | 500 0 | 700 0 | 800 0 |
| 72. හඳුන්කූරු නිෂ්පාදනය කිරීම | 500 0 | 700 0 | 1,000 0 |
| 73. කෘෂි කාර්මික උපකරණ අලෙවිය | 500 0 | 700 0 | 1,000 0 |
| 74. ජංගම දුරකථන කාඩ්පත් අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 75. වීදුරු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 76. පොල්, පුවක් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. වාහන සීට් කුෂන් වැඩපල | 500 0 | 750 0 | 1,000 0 |

| I වැනි තීරය කර්මාන්තය | II වැනි තීරය පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|
| | රු. 750 දක්වා රු. ශත | රු. 750 සිට රු. 1,500 දක්වා රු.ශත | රු. 1,500 ට වැඩි රු.ශත |
| 78. ශල්‍ය ගෝස් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 79. පෞද්ගලික ඉංග්‍රීසි වෛද්‍ය මධ්‍යස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 80. අයිස්ක්‍රීම් යෝගට් වෙළඳාම | 500 0 | 600 0 | 800 0 |
| 81. පාවහන් කඩය | 500 0 | 700 0 | 900 0 |
| 82. ඡායා පිටපත් කඩය | 400 0 | 550 0 | 750 0 |
| 83. කෘෂි පැල තවාන් | 500 0 | 750 0 | 1,000 0 |
| 84. වාහන ස්ටිකර් ගැසීම | 500 0 | 600 0 | 800 0 |
| 85. මහන මැෂින් අලුත්වැඩියාව | 500 0 | 700 0 | 1,000 0 |
| 86. මිරිස් තුනපහ කුඩු පැකට් කර විකිණීම | 500 0 | 700 0 | 850 0 |
| 87. පරණ යකඩ ගබඩාව | 500 0 | 650 0 | 900 0 |
| 88. කරවල කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 89. වාහන පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 90. කලායතනයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 91. උඩරට මුල් ඇඳුම් සැපයීම | 500 0 | 750 0 | 1,000 0 |
| 92. මල්පැල තවාන් | 500 0 | 750 0 | 1,000 0 |

09-684/10

---

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

### රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද - 2017 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 148 වැනි වගන්තිය යටතේ රථ වාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමට එකී පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙන අතර, මෙම බදු මුදල 2017 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර එකී පනතේ 148:3 වැනි වගන්තිය යටතේ ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9:03 අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| | | රු. ශත |
| | මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් හෝ ජින් රික්ෂෝවක් නොවන සෑම වාහනයක් සඳහා | 30 0 |
| | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| | *(අ)* වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් සේවා ගාස්තු | 18 0 |
| | *(ආ)* වෙළඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම් සේවා ගාස්තු | 4 0 |
| 2. | සෑම කරත්තයක් සඳහා සේවා ගාස්තුව | 20 0 |
| 3. | සෑම අත් කරත්තයක් සඳහා සේවා ගාස්තු | 10 0 |
| 4. | සෑම රික්ෂෝවක් සඳහා | 15 0 |
| 5. | සෑම අශ්වයෙකු, පෝනියෙකු, කොටළුවකු සඳහා | 10 0 |
| 6. | සෑම ඇතෙකු සඳහාම | 50 0 |

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පල්ලේපොල.

09-684/9

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

### ඉඩම් විකිණීම මත බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 154(1) වැනි වගන්තිය යටතේ පල්ලේපොල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකක් (1%) හෝ සමාන බද්දක් විකුණුම්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනුප්‍රාප්තියා විසින් එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් පල්ලේපොල ප්‍රාදේශීය සභාවට 2017.01.01 වැනි දින සිට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 වැනි දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පල්ලේපොල.

08-684/3

---

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

### ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත

(176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තුව රු. 500ක් ද, දර්ශන පැවැත්වෙන සෑම දිනයක් සඳහාම රු. 25 බැගින් වූ බලපත්‍ර ගාස්තුවක් 2017.01.01 වැනි දින සිට අය කළ යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 වැනි දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පල්ලේපොල.

12-684/4

---

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

### 2017 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වැනි වගන්තිය ප්‍රකාර පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අය කරනු නොලබන ප්‍රදේශවල පිහිටියා වූ ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ ද, හෙක්ටයාර් 05 සහ ඊට වැඩි ඉඩම්වලින් හෙක්ටයාර් 01ට රු. 10 බැගින් බද්දක් 2017 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන කාර්තු හතරකින් (4) අය කර ගැනීමට ද එකී කාර්තු අවසන් වීමට පෙර අදාළ බදු මුදල් ගෙවිය යුතු බවට ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9(03) අනුව මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.08.22 දින තීරණ අංක 91 යටතේ තීරණය කර ඇති බව දැනුම් දෙනු ලැබේ.

තව ද එකී පනතේ 124 (7) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් පරිදි ගෙවූ විට එහි දැක්වෙන වට්ටම් මුදල් ප්‍රදානය කරනු ලබන බව ද දැනුම් දෙනු ලැබේ.

2017 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු බද්ද ගෙව්වහොත් එසේ ගෙවන මුදලින් සියයට දහයක් (10%).

බදු මුදල් කාර්තු වශයෙන් ගෙවන විට බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමුවන මාසය තුළ දී ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් සියයට පහක් (5%),

තව ද ඉහත පනවන ලද බද්ද නොගෙවන අවස්ථාවක දී ප්‍රාදේශීය සභා පනතේ 161 වැනි වගන්තිය ප්‍රකාර 10% ක වරෙන්තු ගාස්තුවක් අයකරන බව ද නිවේදනය කරමි.

යූ. එච්. ආර්. කේ. කපුකොටුව,
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පල්ලේපොල.

09-684/2

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.